සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# ක්‍රිස්තු ධර්මය

8 ශ්‍රේණිය — කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 20 දක්වා ලබා දී ඇති ප්‍රශ්නවලට ගැලපෙන වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. විශ්මිත නිර්මාණ කිරීමට මිනිසාට ප්‍රඥාව ලබා දුන්නේ,
    (1) සලමොන් රජතුමාය. (2) දාවිත් රජතුමාය
    (3) ශුද්ධාත්මයාණන් වහන්සේය. (4) දෙවියන් වහන්සේය.

02. දේව ස්වරූපයට සහ සමානත්වයට මිනිසා මවනු ලැබීමෙන් ප්‍රකාශවන කරුණක් වන්නේ,
    (1) දෙව්පියාණන්ගේ විශ්වාසකමයි. (2) දෙව්පියාණන්ගේ අනුකම්පාවයි.
    (3) දෙවිඳුන්ගේ අසීමිත ප්‍රේමයයි. (4) දෙවිඳුන්ගේ බලවන්තකමයි.

03. දේව කැමැත්ත ඉටු කිරීමට අප කළ යුතු දෙයක් වන්නේ,
    (1) දේව ගුණාංග අපගේ ජීවිතවල සුරක්ෂිත කළ යුතුය.
    (2) දේව ප්‍රේමය ගැන ගීත ගායනා කළ යුතුය.
    (3) දේව ගුණාංග ගැන අන් අය දැනුවත් කළ යුතුය.
    (4) අන් අයගේ අදහස්වලට සවන් දිය යුතුය.

- අංක 04 - 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

04. ඒදන් උයනෙහි තිබූ තහනම් කරන ලද ගසේ ගෙඩි සංකේතවත් කරනුයේ ..................... යි.
    (1) ආදරයයි. (2) ගෞරවයයි. (3) ප්‍රේමයයි. (4) පාපයයි.

05. 'රෝගීන්ට මිස නිරෝගීන්ට ............. කම් නැත. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
    (1) ධර්මිෂ්ටයාගෙන් (2) විශ්වාසකයාගෙන් (3) වෙදාගෙන් (4) ගුරුතුමාගෙන්

06. ඉශ්‍රායෙල් සෙනගට පාරාවෝ රජතුමා යටතේ වහලුන් ලෙස ගත කිරීමට සිදු වූ අවුරුදු ගණන වන්නේ,
    (1) අවුරුදු 400 ක්ය. (2) අවුරුදු 450 ක්ය. (3) අවුරුදු 430 ක්ය. (4) අවුරුදු 432 ක්ය.

07. සබත් දිනයේදී ඔබ දේව මන්දිරයට යායුතු වන්නේ,
    (1) දෙමාපියන්ගේ බලකිරීම නිසාය. (2) යහළුවන් හමුවීම සඳහාය.
    (3) නීතියක් නිසාය. (4) දෙවිඳුන්ට ඇති අසීමිත ආදරය නිසාය.

08. යහපත් සමාරිතයාගේ කතාවෙන් ඔබට ලබාදෙන පණිවිඩයක් වන්නේ,
    (1) තම ජාතියට අයත් අයට පමණක් උපකාර කළයුතු බවය.
    (2) ජාති කුල ආගම් භේද නොතකා අන් අයට උපකාර කළයුතු බවය.
    (3) ජුදෙව්වන්ට පමණක් උපකාර කළයුතු බවය.
    (4) සමාරිතයන්ට පමණක් කළයුතු බවය.

09. ජේසුස් වහන්සේ අනුගමනය කළ ප්‍රේමයේ ක්‍රියාදාමය නිසා,

(1) ස්ත්‍රී පුරුෂ සැමට එකසේ සේවය කිරිමට අවස්ථාව උදාවිය.

(2) පුරුෂයින්ට පමණක් සේවය කිරීමට අවස්ථාව උදාවිය.

(3) සමාජයේ උසස් පුද්ගලයින්ට පමණක් සේවයට අවස්ථාව උදාවිය.

(4) කාන්තාවන්ට පමණක් සේවයට අවස්ථාව උදාවිය.

10. අපගේ ප්‍රේමණීය එඬේරාණන් සැමවිටම අපව,

(1) විනාශයට යවයි. (2) ආරක්ෂාව ලබාදෙයි.

(3) පෝෂණය ලබාදෙයි. (4) ආරක්ෂාව සහ පෝෂණය ලබාදෙයි.

11. ජේසුස් වහන්සේගේ රැළ අයත් නොවූ එම රැළට ගෙනආ හැකිවන්නේ,

(1) අපගැන ආඩම්බර වීමෙන්ය.

(2) අන්අය විවේචනය කිරීමෙන්ය.

(3) ජේසුස් වහන්සේ අපට දැක්වූ ප්‍රේමය ඔවුන්ට දැක්වීමෙන්ය.

(4) දේශනා කිරීමෙන්ය.

12. බයිබල් අම්මාවරුන් ලෙස සේවය කළ ශ්‍රී ලාංකික ධර්මදූතිකාවක් වන්නේ,

(1) එලීසා ඇග්නිව්ය. (2) තෙරේසා මව්තුමියයි.

(3) ජොයිස්ද සිල්වාය. (4) ඉව්ලින්කානිය.

13. 'යාච්ඤාවෙ ගුරුවරිය ලෙස විරුධාවලිය ලැබුයේ,

(1) ජොයිස් ද සිල්වාය. (2) එලීසා ඇග්නිව්ය.

(3) තෙරේසා මව්තුමියයි. (4) ඉව්ලින් කානිය.

14. නාසරෙත් ධර්මශාලාවේදී ජේසුස් වහන්සේ කියවන්නට යෙදුන දිවසිවර පාඨය ඇතුලත් පොත වන්නේ,

(1) උත්පත්ති පොතය. (2) ජෙරමියා පොතය.

(3) මලාකි පොතය. (4) යෙසායා පොතය.

15. කිතුණු දරුකෙු ලෙස සැමවිටම ඔබට විරුද්ධව ක්‍රියා කරන අය වෙනුවෙන් ඔබ කළයුතු කාර්යයක් වන්නේ,

(1) වෛර කල යුතුය. (2) සමාව දිය යුතුය. (3) අගය කළ යුතුය. (4) හිංසා කළ යුතුය.

16. ජේසුස් වහන්සේ දැකබලා ගැනීමේ ආශාවෙන් අත්තික්කා ගස මුදුනට නැග්ගේ,

(1) සීමොන් ය. (2) පේදුරුය. (3) සකෙවුස්ය. (4) සීමොන්ය.

17. ශුද්ධ වූ බයිබලයේ ඇති මුළු පොත් සංඛ්‍යාව වන්නේ,

(1) 60 කි. (2) 66 කි. (3) 65 කි. (4) 64 කි.

18. ජේසුස් වහන්සේ කුඩා දරුවන්ව නිතරම,

(1) ප්‍රතික්ෂේප කළ සේක. (2) අගය කළ සේක.

(3) තරවටු කළ සේක. (4) අවවාද කළ සේක.

19. ජේසුස් වහන්සේ නාසරෙත්හි කල දේශනයේ අඩංගු එක් කරුණක් වන්නේ,

(1) දිළිඳුන්ට සුබාරංචි දේශනා කිරීමය. (2) අනාථවූවන්ට සහනාධාර ලබාදීමය.

(3) දළිඳුන්ට නිවාස සකස්කර දීමය. (4) දිළිඳුන්ට ආහාර ලබාදීමය.

20. ශ්‍රාවකයන් ජේසුස් වහන්සේ වෙතින් බලය ලැබූ විශේෂ කාර්යන් අතර එක් කාර්යයක් වන්නේ,

(1) රෝගීන් පවිත්‍ර කිරීමයි. (2) රෝගීන් සුව කිරීමයි.

(3) රෝගීන්ට උපස්ථාන කිරීමයි. (4) රෝගීන්ට රැකවරණය සැලසීමයි.

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (1) ශුද්ධ වූ බයිබලයේ අවසාන පොත නම් කරන්න.
    (2) චක්‍රාකාර දේව නිමවුම් 2 ක් ලියන්න.
    (3) ඉශ්‍රායෙල් සෙනගට බීමට නොහැකි තරම් වූ ජලය හමුවූ ස්ථානය කුමක්ද?
    (4) දේව මැවිල්ල ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි දේවල් 2 ක් ලියන්න.
    (5) ජේසුස් වහන්සේගේ ගෝලයෙකු වන ලෙවී හෙවත් මතෙව් හමුවූයේ කුමන ස්ථානයේ සිටියදීද?
    (6) ගෙනසෙරත් විල හඳුන්වන තවත් නමක් ලියන්න.
    (7) දේව සේවයට කැඳවීම ලබන අය තුළ තිබිය යුතු ගුණාංග 02 ක් ලියන්න.
    (8) ශ්‍රාවකයින් තෝරාගැනීමට පෙර ජේසුස් වහන්සේ කළ විශේෂ කාර්ය කුමක්ද? (ල. 2x8=16)

02. (1) දේව කැඳවීම යනු කුමක්ද? (ල. 02)
    (2) ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකත්වය සඳහා ගලීලයේ මුහුද අසලදී කැඳවූ ගෝලයින් තුන්දෙනෙක් නම් කරන්න. (ල. 03)
    (3) කිතුණු දරුවෙකුවන ඔබ තුළ තිබිය යුතු ගුණාංග 06 ක් ලියන්න. (ල. 06)

03. (1) 'සමිඳාණෝ මා එඬේරාණෝය. අඟහිඟ මට නොවන්නේ ය..........
    මෙම ගීතය ඇතුලත් ගීතාවලිය පොත ලියූ කතුවරයා කව්ද? (ල. 02)
    (2) යහපත් එඬේරාණන් සතු ගුණාංග 03 ක් ලියන්න. (ල. 03)
    (3) පන්තිකාමරය තුළ / පාසල තුළ ඔබට නායකත්වය දැරීමට අවස්ථාව ලැබුනහොත් ඔබ ක්‍රියාකරන ආකාරය කරුණු 06 කින් පෙන්වා දෙන්න. (ල. 06)

04. (1) ඉශ්‍රායෙල් සෙනඟට නායකත්වය ලබාදීමට දෙවියන්වහන්සේ කැඳවූ විශේෂ පුද්ගලයා කවුද? (ල. 02)
    (2) ඉශ්‍රායෙල් සෙනඟගේ වර්ධනය වීම පාලනය කිරීම සඳහා පාරාවෝ රජතුමාගත් ක්‍රියාමාර්ග 02 ක් ලියන්න. (ල. 03)
    (3) ''දෙව්පියාණන් වහන්සේ අපව රැකගනිමින්, අපව ආරක්ෂාකරමින්, සුවය ලබාදෙමින්, පෝෂණය කරමින් නිරතුරු අප ළඟ සිටිමින් අපට මඟ පෙන්වන සේක.''
    ජීවිතයේ ඔබ ලැබූ සියලු ආශිර්වාද ගැන ප්‍රකාශ කරමින් ස්තුති කිරීමේ යාච්ඤාවක් ලියන්න. (ල. 06)

05. (1) අපේ ආදිමව්පියන් පාපයට වැටීම නිසා අහිමිකරගත්තේ කුමක්ද? හිමිකරගත්තේ කුමක්ද? (ල. 02)
    (2) වර්තමාන සමාජය තුළ කිතුණු අපවෙත පැමිණෙන පරීක්ෂාවන් 03 ක් ලියන්න. (ල. 03)
    (3) අපවෙත එන පරීක්ෂාවන්ට මුහුණ දීමට ශක්තිය ඉල්ලා කරන යාච්ඤාවක් ලියන්න. (ල. 06)

06. (1) දෙව් සමිඳාණන් විසින් මැවිල්ල තුළ මිනිසාට අසමසම ස්ථානයක් හිමිකර දුන්නේ ඇයි? (ල. 02)
    (2) දේව කැමැත්ත ඉටුකිරීම සඳහා ඔබට කළහැකි දේවල් තුනක් ලියන්න. (ල. 03)
    (3) මිනිසා දේව මැවිල්ල විනාශකරන අවස්ථා තුනක් ලියා විස්තර කරන්න. (ල. 06)

**පිළිතුරු පත්‍රය - I කොටස**

01. ( 4 ) 02. ( 3 ) 03. ( 1 ) 04. ( 4 ) 05. ( 3 ) 06. ( 3 ) 07. ( 4 ) 08. ( 2 ) 09. ( 1 ) 10. ( 4 )
11. ( 3 ) 12. ( 1 ) 13. ( 1 ) 14. ( 4 ) 15. ( 2 ) 16. ( 3 ) 17. ( 2 ) 18. ( 4 ) 19. ( 1 ) 20. ( 2 )

**II කොටස**

01. (1) එළිදරව්ව

(2) වර්ෂාව ඇතිවීම, ඍතු භේදය, බීජයකින් නව ඵලයක් හට ගැනීම, හදවතෙහි ක්‍රියාකාරීත්වය, නව දරු උපත්

(3) මාරා

(4) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබාදෙන්න.

(5) බදුපොළේදී.

(6) ගලීලයේ මුහුද

(7) නිහතමානීකම, අවංකකම, කීකරුකම, ඇදහිල්ල, පසුතැවීම.

(8) යාච්ඤා කිරීම. (ල. 8 x 2 =16)

02. (1) දේව මෙහෙවරෙහි විශේෂ කාර්යයක් සඳහා දෙවියන් වහන්සේ තෝරා ගැනීම. (ල. 02)

(2) සීමොන්, අන්ද්‍රෘ, ජොහාන්, ජාකොබ් (ල. 03)

(3) ලියා ඇති කරුණු වලට අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

03. (1) දාවිත් රජතුමාය. (ල. 02)

(2) රැකබලා ගැනීම, පෝෂණය කිරීම, නිවැරදි මඟ පෙන්වීම. (ල. 03)

(3) ලියා ඇති කරුණුවලට අදාළව ලකුණු ලබා දෙන්න. (ල. 06)

04. (1) මෝසෙස් (ල. 02)

(2) ඉශ්‍රායෙල් සෙනඟට ඔරොත්තු නොදෙන තරම් බර වැඩ ගැනීම, පිරිමි දරුවන් උපතේදීම විනාශ කිරීම, සෑම පිරිමි දරුවෙකුම නයිල් ගඟට විසි කිරීම (ල. 03)

(3) ලියා ඇති යාච්ඤාවට අනුව ලකුණු ලබාදෙන්න. (ල. 06)

05. (1) අහිමි කරගත්තේ - සදාකාල ජීවනය හිමි කරගත්තේ - මරණය (ල. 02)

(2) නොගැලපෙන විලාසිතා
සබත් දින වෙනත් දේවලට යොමු වීම.
නොගැලපෙන මිතුරු ඇසුර (ල. 03)

(3) ලියා ඇති කරුණුවලට අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)

06. (1) උන්වහන්සේ අප කෙරෙහි දක්වන අසමසම ප්‍රේමය නිසා (ල. 02)

(2) දෙවිපියාණන් කෙරෙහි පූර්ණ විශ්වාසය ඇදහිල්ල රැදවීම, දේව මැවිල්ලේ දායාද සුරක්ෂිත කිරීම, වර්ධනය කිරීමේ භාරකරුවන් ලෙස ක්‍රියා කිරීම, දේව ගුණාංග අප ජීවිත තුළ සුරක්ෂිත කිරීම, ආදර්ශමත් ජීවිත රටාවක් පවත්වා ගැනීම. (ල. 03)

(3) ලියා ඇති කරුණුවලට අදාළව ලකුණු ලබා දෙන්න. (ල. 06)